සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

- පහත සිද්ධිය ඇසුරෙන් 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවය කළ ශ්‍රී නිමල් "මල් ප්‍රඩක්ෂන්" නමින් යූ ටියුබ් (you tube) චැනලයක් ආරම්භ කරන ලදී. ඔහු කාලීන සිදුවීම් ඇසුරෙන් කෙටි චිත්‍රපට නිර්මාණය කර අන්තර්ජාලයට මුදා හරින ලදී.

01 "මල් ප්‍රඩක්ෂන්" යූ ටියුබ් චැනලය සපුරාලන අවශ්‍යතාවය නොවන්නේ,
(1) අධ්‍යාපනය (2) විනෝදය (3) සන්නිවේදනය (4) සෞඛ්‍යය

02 "මල් ප්‍රඩක්ෂන්" යූ ටියුබ් චැනලය,
(1) හවුල් ව්‍යාපාරයකි. (2) සමාගමකි. (3) තනි පුද්ගල ව්‍යාපාරයකි. (4)සංස්ථාවකි.

03 "මල් ප්‍රඩක්ෂන්" ව්‍යාපාරය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) මෙම ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්ය නොවේ. (2) මෙම ව්‍යාපාරය සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.
(3) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත. (4) මෙම ව්‍යාපාරයේ පැවැත්ම අඛණ්ඩ වේ.

04 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,
(1) රාජ්‍ය මූල්‍ය රෙගුලාසි වලට යටත් නොවේ.
(2) විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවයි.
(3) තීරණ ගැනීමේ ස්වාධීනත්වයක් නැතිවීම.
(4) රජය විසින් පත් කරන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වේ.

05 යූ ටියුබ් චැනල් සන්නිවේදන ක්‍රමය අයත් වන වඩාත් නිවැරදි සන්නිවේදන මාධ්‍යයන් වන්නේ,
(1) ලිඛිත (2) වාචික (3) සංඥා හා සංකේත (4) විද්‍යුත් හා වාචික

06 ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව හා ඔවුන් ව්‍යාපාරයෙන් අපේක්ෂා කරන අරමුණු වඩාත් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
(1) රජය - අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම (2) ගනුදෙනුකරුවෝ - සාධාරණ වැටුප් ලබා ගැනීම
(3) සැපයුම්කරුවෝ - නිසි පරිදි මුදල් ලබා ගැනීම (4) මූල්‍ය ආයතන - තරගයට මුහුණ දීම

07 බාහිර පරිසර සාධක පමණක් ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) ගනුදෙනුකරුවෝ, තරගකරුවෝ, සැපයුම්කරුවෝ
(2) තරගකරුවෝ, කළමණාකරුවෝ, සේවකයෝ
(3) සේවකයෝ, පාරිභෝගිකයෝ, තරගකරුවෝ
(4) තරගකරුවෝ, අයිතිකරුවෝ, සේවකයෝ

08 තාක්ෂණික පරිසරයේ වෙනස්කමක් නොවන්නේ,
(1) කෙටි කාලයකින් නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් අඩු පිරිවැයකින් රෙදි නිෂ්පාදනය කිරීම.
(2) සාමාන්‍ය තැපැල වෙනුවට විද්‍යුත් තැපැල භාවිතය.
(3) මහ බැංකුව බැංකු පොලී අනුපාත ඉහළ දැමීම.
(4) පරිගණක තොරතුරු පද්ධති භාවිතයෙන් ගිණුම් තැබීම.

09 ජාත්‍යන්තර වශයෙන් භාවිත වන ණයපත් ජාල පමණක් ඇති පිළිතුර තෝරන්න.
(1) වීසා, ඇමරිකන් එක්ස්ප්‍රස්, පෙට් (2) ඇමරිකන් එක්ස්ප්‍රස්, වීසා, සෙට්
(3) ඇමරිකන් එක්ස්ප්‍රස්, වීසා, මාස්ටර් (4) ඇමරිකන් එක්ස්ප්‍රස්, පෙට්, මාස්ටර්

10 චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ වම් පස සිට පළමුවෙන්ම මුද්‍රණය වී ඇත්තේ,

(1) චෙක්පත් අංකය යි. (2) බැංකුවේ අංකය යි. (3) ශාඛාවේ අංකය යි. (4) බැංකු ගිණුම් අංකය යි.

11 රක්ෂණය සම්බන්ධව අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) රක්ෂණයේ දී පළමු පක්ෂය වන්නේ, අදාල රක්ෂණ ආයතනය වේ.

(2) හානි පූරණ මූලධර්මය ජීවිත රක්ෂණය සඳහා අදාළ නොවේ.

(3) ජීවිත හෝ දේපළ රක්ෂණය කළ විට ඒවායේ අවදානම නැති වන්නේ නැත.

(4) ජීවිත රක්ෂණ ඔප්පුව මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීමේදී ඇපයක් ලෙස භාවිත කළ හැක.

12 සන්නිවේදන ක්‍රියාවලියේදී ප්‍රතිපෝෂණය ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) පණිවුඩය ලබන්නා පණිවුඩය සම්බන්ධව ක්‍රියාකරන ආකාරය.

(2) යවන්නා විසින් සපයනු ලබන තොරතුරු.

(3) ලබන්නා හට පණිවුඩය ලැබීම.

(4) පණිවුඩය ලැබුණු බවට ලබන්නාගෙන් යවන්නාට ලැබෙන ප්‍රතිචාරය.

13 ප්‍රවාහනයේ මූලිකාංග සම්බන්ධ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

A. මාතර කතරගම අධිවේගී මාර්ගය ඉදිකිරීම.

B. කොළඹ වරාය පුළුල් කිරීම.

C. ගුවන් සමාගමක් විසින් ගුවන් යානා 03ක් මිලට ගැනීම.

ඉහත ප්‍රකාශ අතරින් "පර්යන්තය" යන්නට අදාළ සිදුවීම් දැක්වෙන ප්‍රකාශය වන්නේ,

(1) A,B,C සියල්ලම (2) C පමණි (3) B පමණි (4) B, C පමණි

14 සිල්ලර වෙළෙඳාමේ දක්නට ලැබෙන ලක්ෂණ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) සිල්ලර වෙළෙඳාමේ වට්ටම් බහුලව දක්නට ලැබේ.

(2) සිල්ලර මිල සාපේක්ෂව අඩු වේ.

(3) භාණ්ඩ වර්ග එකක් හෝ සීමිත සංඛ්‍යාවක් අලෙවි කරයි.

(4) අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම සිදු කරයි.

15 පහත X තීරයේ කලමනාකරණ මූලිකාංගද, Y තීරයේ පාසලක කලා උළෙලක දක්නට ලැබූ කාර්යයන් කිහිපයක්ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. සැලසුම්කරණය | a. ගුරුවරුන් විසින් උත්සව දින කටයුතු මෙහෙයවීම |
| 2. සංවිධානකරණය | b. උත්සව දින න්‍යාය පත්‍රය අනුව කටයුතු සිදු වේදැයි සොයා බැලීම |
| 3. මෙහෙයවීම | c. කලා උළෙල පැවැත්විය යුතු දිනය තීරණය කිරීම |
| 4. පාලනය | d. උත්සවය සඳහා විවිධ කමිටු පත්කිරීම |

X හා Y තීර නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) 1 - c, 2 - d, 3 - a, 4 - b (2) 1 - d, 2 - c, 3 - a, 4 - b

(3) 1 - c, 2 - d, 3 - b, 4 - a (4) 1 - d, 2 - c, 3 - b, 4 - a

16 අලෙවිකරණයේ දී නිෂ්පාදිත පාරිභෝගිකයන් වෙත ලබා දීම සම්බන්ධ වූ කාර්යයන් හඳුන්වනු ලබන්නේ,

(1) මිල ලෙස ය. (2) ස්ථානය ලෙස ය. (3) නිෂ්පාදිතය ලෙස ය. (4) ප්‍රවර්ධනය ලෙස ය.

17 ව්‍යාපාරයක වත්කම් පමණක් ඇති පිළිතුර වන්නේ,

(1) ණයගැතියෝ, මුදල් ශේෂය, බැංකු අයිරාව (2) බැංකු ශේෂය, ණයහිමියෝ, බඩු තොගය

(3) මෝටර් රථ, මුදල් ශේෂය, බැංකු ශේෂය (4) ගොඩනැගිලි, ණයගැතියෝ, බැංකු ණය

18 කොමිස් ලැබීම්, පොලී ලැබීම්, ආයෝජන ආදායම් මගින් ව්‍යාපාරයේ ආදායම් වැඩි වේ. මෙම ආදායම් හේතුවෙන් ව්‍යාපාරයේ,

(1) වත්කම් වැඩි වේ, හිමිකම් වැඩි වේ. (2) වත්කම් වැඩි වේ, වගකීම් වැඩි වේ.

(3) හිමිකම් වැඩි වේ, වියදම් වැඩි වේ. (4) වගකීම් අඩු වේ, හිමිකම් අඩු වේ.

19 ව්‍යාපාරයේ අයිතිකරු විසින් මෝටර් රථයක් ව්‍යාපාරයට ගෙන ඒමට අදාල නිවැරදි ද්විත්ව බලපෑම වන්නේ,

(1) මුදල් වත්කම වැඩි වේ, හිමිකම වැඩි වේ.

(2) මෝටර් රථ වත්කම වැඩි වේ, හිමිකම වැඩි වේ.

(3) මෝටර් රථ වත්කම වැඩි වේ, මුදල් වත්කම අඩු වේ.

(4) මුදල් වත්කම වැඩි වේ, මෝටර් රථ වත්කම වැඩි වේ.

20 වත්කම් වැඩි වී වත්කම් අඩු වීමට අදාල නිවැරදි ගනුදෙනුව වන්නේ,

(1) ව්‍යාපාරයට රු. 1,000,000 ක බැංකු ණයක් ලබා ගැනීම

(2) රු. 10,000 ක බඩු තොගයක් කලණගේ ව්‍යාපාරයෙන් ණයට ගැනීම.

(3) අයිතිකරු විසින් රු. 100,000 ක් ව්‍යාපාරයට යෙදවීම.

(4) භාණ්ඩ තොගයක් රු. 50,000 කට ණයට විකිණීම

21 විකුණුම් ගිණුම අයත් වන්නේ,

(1) වියදම් ගිණුමකට ය. (2) වත්කම් ගිණුමකට ය.

(3) ආදායම් ගිණුමකට ය. (4) වගකීම් ගිණුමකට ය.

22 බැංකුව විසින් ලබා දෙන බැංකු අයිරාව ව්‍යාපාරයට,

(1) වත්කමකි (2) වගකීමකි

(3) වියදමකි (4) ආදායමකි

23 බැංකු ප්‍රකාශනයේ බැර තීරුවේ ඇතුලත් අයිතම වන්නේ,

(1) බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු, අයිරා පොලී

(2) ස්ථාවර නියෝග මත ගෙවීම්, බැංකු ගාස්තු, අයිරා පොලී

(3) ණයගැති ප්‍රේෂණ, පොලී ලැබීම්, අයිරා පොලී

(4) ලාභාංශ ලැබීම්, ණයගැති ප්‍රේෂණ, පොලී ලැබීම්

24 ඩියාන් සංජනගේ ව්‍යාපාරයේ ණයහිමි ගෙවීමක දී ලද වට්ටම් සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) දුන් වට්ටම් ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර

(2) ඩියාන් සංජන ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර

(3) ණයහිමි ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර

(4) ලද වට්ටම් ගිණුම හර, මුදල් පොත බැර

25 ගිණුම්කරණයේ දී ද්විත්ව කාර්යයක් ඉටු කරන මූලික සටහන් පොත වන්නේ,

(1) සුළු මුදල් පොත (2) ගැණුම් ජ'නලය

(3) විකුණුම් ජ'නලය (4) පොදු ජ'නලය

26 වෙළෙඳ භාණ්ඩ ණයට ගැණුම්, ගැණුම් ජ'නලයේ සටහන් කිරීමෙන් පසුව ලෙජරයේ ඇති ඒ ඒ ණයහිමි ගිණුම් වලට ........................ බැර කරයි. හිස්තැනට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

(1) අදාළ දින පිළිවෙලට

(2) අදාළ මාසය අවසානයේ දී

(3) අදාළ වර්ෂය අවසානයේ දී

(4) ගිණුම් කාලච්ඡේදය අවසානයේ දී

27 විකුණුම් ජ'නලයේ ඇතුලත් කරන ගනුදෙනුවක් වන්නේ,

(1) රු. 10,000ක තොගයක් රු. 12,000 කට විකිණීම.

(2) ව්‍යාපාරයේ භාවිත කළ පරිගණකය රු. 50,000කට ණයට විකිණීම.

(3) රු. 20,000 කට ව්‍යාපාරයේ තොගයක් අත්පිට මුදලට විකිණීම.

(4) වෙළඳ භාණ්ඩ තොගයක් රු. 30,000 කට ණයට විකිණීම.

28 පොදු ජ'නලයට අදාල මූලාශ්‍ර ලේඛනය වන්නේ,

(1) ඉන්වොයිසිය (2) ජ'නල් වවුචරය (3) ගෙවීම් වවුචරය (4) පිළිපත

29 යම් කාලච්ඡේදයක් අවසානයේ ලෙජර් ගිණුම්වල හර ශේෂ සහ බැර ශේෂ වෙන වෙනම තීරු දෙකක ඇතුළත් කර පිළියෙල කරන ලැයිස්තුව හඳුන්වන්නේ,

(1) ශේෂ සැසඳීමේ ලේඛනය ලෙස ය. (2) ශේෂ පිරික්සුම ලෙස ය.

(3) පොදු ජ'නලය ලෙස ය. (4) පොදු ලෙජරය ලෙස ය.

30 පහත දක්වා ඇත්තේ ගිණුම්කරණ වරදක් නිවැරදි කිරීමට අදාල වූ ජ'නල් සටහන්ය.

රක්ෂණ ගාස්තු ගිණුම - හර 8,000

අවිනිශ්චිත ගිණුම - බැර 8,000

ගිණුම් තැබීමේදී සිදුවූ වරද වන්නේ,

(1) රු. 8,000/= ක රක්ෂණ ගාස්තු ගෙවීම පිළිබඳ කිසිදු සටහනක් තබා නොතිබීම.

(2) රු. 4,000/= ක රක්ෂණ ගාස්තු එම ගිණුමේ සටහන් නොවීම.

(3) රු. 4,000/= ක රක්ෂණ ගාස්තු ගෙවීම රක්ෂණ ගාස්තු ගිණුමේ බැරට සටහන් වීම.

(4) රු. 8,000/= ක රක්ෂණ ගාස්තු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට නොගැනීම.

31 ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු. 250,000කි. බැර පැත්තේ එකතුව රු.235,000 කි. අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කළ යුතු වන ටිනාකම වන්නේ,

(1) රු. 15,000 ක හර ශේෂය (2) රු. 15,000 ක බැර ශේෂය

(3) රු. 250,000 ක හර ශේෂය (4) රු. 250,000 ක බැර ශේෂය

32 Acc Pac, Quick Book, MYOB යන නම් වලින් හඳුන්වනු ලබන්නේ,

(1) පරිගණක ආරක්ෂණ මෘදුකාංග (2) පරිගණක ගිණුම්කරණ මෘදුකාංග

(3) වදන් සැකසුම් මෘදුකාංග (4) පරිගණක බැංකුකරණය ආශ්‍රිත මෘදුකාංග

33 සාගරගේ ව්‍යාපාරයේ 2024 වර්ෂයට අදාල මාසික ගොඩනැගිලි කුලිය රු. 3,000 කි. 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදලින් ගෙවූ කුලිය රු. 30,000කි. ඉතිරි කුලිය ගැලපීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ගොඩනැගිලි කුලී ගිණුම - හර 6,000 ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම - බැර 6,000

(2) ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම - හර 6,000 ගොඩනැගිලි කුලී ගිණුම - බැර 6,000

(3) ගොඩනැගිලි කුලී ගිණුම - හර 6,000 මුදල් ගිණුම - බැර 6,000

(4) ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම - හර 6,000 මුදල් ගිණුම - බැර 6,000

34 ව්‍යාපාරයක් 2023.1.1 දින රු. 500,000 ක යන්ත්‍රයක් මිලට ගන්නා ලදී. එහි ඵලදායී ජීවකාලය වර්ෂ 5 කි. ඵලදායී ජීවකාලය අවසානයේ සුන්බුන් අගය රු.50,000 කි. 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා යන්ත්‍ර ක්ෂය වටිනාකම වන්නේ,

(1) රු. 320,000 කි. (2) රු. 180,000 කි.

(3) රු. 100,000 කි. (4) රු. 90,000 කි.

- පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 35 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| 2024.1.1 දිනට තොගය | 30 000 |
| බෙදාහැරීම් මෝටර් රථය (පිරිවැය) | 120 000 |
| ණයගැතියෝ | 35 000 |
| මුදල් | 14 500 |
| ණයහිමියෝ | 40 000 |
| බැංකු ණය | 50 000 |
| විදුලි ගාස්තු | 7 000 |
| ගැණුම් | 100 000 |
| විකුණුම් | 160 000 |
| ලද වට්ටම් | 7 200 |
| ගෙවූ විකුණුම් කොමිස් | 800 |
| ගොඩනැගිලි කුලිය | 12 000 |
| බැංකු ණය පොලිය | 3 500 |
| සේවක වේතන | 18 000 |
| ගැනිලි | 5 000 |

අතිරේක තොරතුරු,

1. 2024.12.31 දිනට ඉතිරි තොගය රු. 20 000 කි.
2. බෙදාහැරීම් මෝටර් රථය වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය මත 10% ක් ක්ෂය කළ යුතුය. (සුන්බුන් අගයක් නොමැත.)
3. බැංකු ණය සඳහා වාර්ෂික පොළී අනුපාතය 10% කි. එම ණය 2024/1/1 ලබාගෙන ඇත.

35 ඉහත ව්‍යාපාරයේ 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා දළ ලාභය සොයන්න.

(1) රු. 61 200 (2) රු. 60 000 (3) රු. 50 000 (4) රු. 30 000

36 මෙම ව්‍යාපාරයේ 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා බෙදාහැරීම් රථයේ වාර්ෂික ක්ෂය වියදම වන්නේ,

(1) රු. 120 000 (2) රු. 12 000 (3) රු. 12 600 (4) රු. 1000

37 ඉහත ව්‍යාපාරයේ 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්විය යුතු බෙදාහැරීමේ හා මූල්‍ය වියදමක් පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) විකුණුම් කොමිස් , ගොඩනැගිලි කුලී (2) බැංකු ණය පොලිය , විකුණුම් කොමිස්

(3) විකුණුම් කොමිස් , බැංකු ණය පොලිය (4) විකුණුම් කොමිස් , බැංකු ණය

38 මෙම ව්‍යාපාරයේ 2024.12.31 ට පිළියෙල කරන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් කළ යුතු උපචිත බැංකු ණය පොළිය කොපමණද?

(1) රු. 6 500 කි. (2) රු. 5 000 කි. (3) රු. 3 500 කි. (4) රු. 1 500 කි.

39 මෙම ව්‍යාපාරයේ 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය කොපමණද?

(1) රු. 57 200 කි. (2) රු. 50 000 කි. (3) රු. 19 400 කි. (4) රු. 2 400 කි.

40 ව්‍යාපාරයේ 2024.1.1 දිනට ප්‍රාග්ධනය රු. 360 000 ක් පැවතියේ නම් 2024.12.31 දිනට හිමිකම කොපමණද?

(1) රු. 362 400 (2) රු. 357 600 (3) රු. 357 400 (4) රු. 355 000

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II | කාලය පැය 2 යි

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකයː

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බේකරි නිෂ්පාදනය පිළිබඳ පාඨමාලාවක් හැදෑරූ සුමිත් සහ මිහිර එක්වී ජනාකීර්ණ මංසන්ධියක ''සුමිහිරි බේක් හවුස්'' නමින් බේකරි අයිතම නිෂ්පාදනය කොට අලෙවි කරන ව්‍යාපාරයක් 2025.03.01 දින දෙදෙනාම රු. 300 000 බැගින් ප්‍රාග්ධනය ලෙස යොදවා ආරම්භ කරන ලදී. මූල්‍ය ශක්තිය වැඩි කර ගැනීම සඳහා 10% වාර්ෂික පොලියකට රු. 600 000 ක බැංකු ණයක් ද රු. 300 000 ක් වැය කර පාන් නිපදවන යන්ත්‍රයක් ආරම්භක දිනයේම ලබා ගන්නා ලදි. සැලසුම් කළ පරිදි ගුණාත්මයෙන් උසස් අමු ද්‍රව්‍ය යොදා ගැනීම නිසාත් නිෂ්පාදනය පිළිබඳ සොයා බලන නිසාත් තවත් බේකරියක් තිබුනද ඔවුන්ගෙ නිෂ්පාදිත සඳහා ඉහළ ඉල්ලුමක් නිර්මාණය විය. බේකරියේ කටයුතු සඳහා නුපුහුණු සේවකයෙක් බඳවා ගන්නා ලදී. බේකරි නිෂ්පාදිත අවට හෝටල් හා ආපනශාලාවලට කුලියට ගත් ත්‍රීරෝද රථයෙන් බෙදා හරින අතර ඔවුන්ගේ වෙළෙඳසැල තුලද නිෂ්පාදිත අලෙවි කරයි. එම මාසය තුළ ලාභ අලාභ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ඊළඟ මාසයේදී ත්‍රීරෝද රථයක් මිලට ගැනීමට තීරණය විය. 2025.03.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගණුදෙනු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය අත්පිට ගැණුම් | රු. | 200 000 |
| අමුද්‍රව්‍ය ණයට ගැණුම් | රු. | 80 000 |
| ගොඩනැගිලි කුලි | රු. | 20 000 |
| සේවක වැටුප් | රු. | 30 000 |
| විදුලි ගාස්තු | රු. | 10 000 |
| ත්‍රීරෝද රථ කුලී | රු. | 15 000 |
| ඇසුරුම් වියදම් | රු. | 10 000 |
| අත්පිට විකුණුම් | රු. | 490 000 |

අතිරේක තොරතුරු

2025.03.31 දිනට ඉතිරි තොග කිසිවක් නැත.

යන්ත්‍ර 6% ක් වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

2025.03.31 දිනට බැංකු ණය පොළිය උපචිතව ඇත.

(i) (අ) සුමිහිරි බේක් හවුස්'' අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) ''සුමිහිරි බේක් හවුස්'' යන ව්‍යාපාර නාමය ලියාපදිංචි අනිවාර්යද නැද්ද යන්න සඳහන් කර එහි නීතිමය තත්ත්වය පහදන්න.

(ii) ''සුමිහිරි බේක් හවුස්'' ආයතනයේ පරිසර විශ්ලේෂණය තුලින් පහත සාධක වලට නිදසුන් සිද්ධිය තුලින් ලියන්න.

(අ) ශක්තිය

(ආ) තර්ජන

(ඉ) දුර්වලතා

(ඊ) අවස්ථා

(iii) (අ) ''සුමිහිරි බේක් හවුස්'' ව්‍යාපාරය ලබා ගත් උපකාරක සේවා 02 සඳහන් කර එම උපකාරක සේවා ලබා ගෙන ඇති බව තහවුරු කිරීමට සිද්ධියේ සඳහන් නිදසුන බැගින් ලියන්න.

උපකාරක සේවා | නිදසුන

(1) ............................................ ....................................................

(2) ............................................ ....................................................

(ආ) ඉහත සිද්ධිය ඇසුරෙන් දේශීය වෙළඳාමේ ප්‍රභේද 02 ට අදාල නිදසුන් සපයන්න.

(1) තොග වෙළෙඳාම - ..............................................

(2) සිල්ලර වෙළෙඳාම - ..............................................

(iv) පහත සඳහන් (අ), (ආ) ප්‍රකාශ අලෙවිකරන මිශ්‍රයේ කුමන විචල්‍යට අයත් වේද සහ (ඉ), (ඊ) ප්‍රකාශ කුමන කළමනාකරණ කාර්යන්ට අදාල වේදැයි ලියන්න.

(අ) ගුණාත්මක තත්ත්වයෙන් උසස් බේකරි නිෂ්පාදන.

(ආ) ත්‍රීරෝද රථයෙන් නිෂ්පාදිත බෙදා හැරීම.

(ඉ) නුපුහුණු සේවකයෙක් බඳවා ගැනීම.

(ඊ) සැලසුම් කළ පරිදි කලාපයේ ගුණත්වයෙන් උසස් ලෙස නිෂ්පාදනය කිරීම පිළිබඳ සොයා බැලීම.

(v) 2025.03.01 දිනට මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.

(vi) (අ) 2025.03.31 දිනට ලබා ගත් බැංකු ණය සඳහා මාසික පොලිය ගණනය කරන්න.

(ආ) ගෙවියයුතු ණය පොලිය ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන අගයන් සහිතව ලියා දක්වන්න.

(vii) (අ) පාන් නිෂ්පාදන යන්ත්‍රයේ මාසික ක්ෂය ගණනය කරන්න.

(ආ) ජංගම නොවන වත්කම් වල 2025.03.31 දිනට අගය ගණනය කරන්න.

(viii) 2025.03.31 දිනට අත ඉතිරි මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

(x) 2025.03.31 දිනට මුළු හිමිකම ගණනය කරන්න.

(ලකුණු 2 x 10 = 20)

## I කොටස

02. (i) (අ) ''බාටර් ක්‍රමය'' යන්න හදුන්වන්න.

(ආ) වර්තමානයේදී විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් කළ හැකි ව්‍යාපාර කාර්යයක් නම් කරන්න. (ල. 02)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) පෞද්ගලික අංශයේ ව්‍යාපාර ලාභ අපේක්ෂාවෙන් පමණක්ම කටයුතු කරයි. ( )

(ආ) අවශ්‍යතා අසීමිත වන අතර වුවමනා විවිධ වීම. ( )

(ඉ) ව්‍යාපාරයෙන් අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම සැපයුම්කරුවන්ගේ අරමුණකි. ( )

(ඊ) නව තාක්ෂණයට අනුගත වීම දුෂ්කර වීම තර්ජනයකි. ( )

(ල. 02)

(iii) නව රජය ඉදිරිපත් කළ අයවැය ප්‍රතිපත්තිය තුල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා අඩු පොලී ණය යෝජනා ක්‍රම හදුන්වා දෙන බව ප්‍රකාශ කර ඇත.

(අ) ඉහත ප්‍රකාශය තුළ ඇතුලත් අයවැය ප්‍රතිපත්තිය අයත් බාහිර පරිසර බලවේගය නම් කරන්න.

(ආ) ඉහත ප්‍රකාශය තුළ ඇතුලත් අයවැය ප්‍රතිපත්තිය තුල ඇති ව්‍යාපාර අවස්ථාවක් ලියන්න.

(ල. 02)

(iv) පහත දැක්වෙන්නේ ව්‍යාපාර නාම කිහිපයකි.

1. හෙද පුහුණු පාසල

2. නිරෝගා ඔසුසල

3. විජය පපඩම්

4. ශක්ති හෙල්මට් නිෂ්පාදකයෝ

(අ) ඉහත එක් එක් ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව ලියන්න.

(ආ) ඉහත එක් එක් ව්‍යාපාරය නිෂ්පාදිතවල ස්වභාවය අනුව අයත් වන ව්‍යාපාර වර්ගය සඳහන් කරන්න (ල. 02)

(මුළු ලකුණු 08)

03. (i) (අ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ පදනම් 02 ක් ලියන්න.

(ආ) හවුල් ගිවිසුම යනු කුමක්ද? (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සංස්ථාපිත සමාගම්වල කළමණාකරණය, අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදුකරයි. (     )

(ආ) සමුපකාර සමිතියක සියලු වත්කම් වල අයිතිය එහි සභාපතිවරයා සතු වේ. (     )

(ඉ) රාජ්‍ය දෙපාර්තමේන්තුවල තීරණ ගැනීමේ ස්වාධීනත්වයක් ඇත. (     )

(ඊ) රාජ්‍ය සංස්ථාවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ. (     )

(ල. 02)

(iii) පහත සඳහන් ව්‍යාපාර හිමිකාරිත්වය මත අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය ලියා දක්වන්න.

(අ) දාස සහ සහෝදරයෝ ව්‍යාපාරය

(ආ) සී/ස සෙලින්කෝ රක්ෂණ සමාගම

(ඉ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය

(ඊ) ''සැලෝන් තාරු'' රූපලාවන්‍යය අයතනය (ල. 02)

(iv) ධනුක බොජුන්හලකට ගොස් බිල්පතක් ගෙවා දැමීමේදී භාවිත කළේ බැංකු ගිණුමක් අනිවාර්යයෙන් පැවතිය යුතු විද්‍යුත් කාඩ්පතකි.

(අ) ඔහු භාවිත කළ කාඩ්පත් වර්ගය විය හැක්කේ කුමක් ද?

(ආ) ඔහු භාවිත කළ විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා වල වාසි 02 ක් ලියන්න. (ල. 02)

(මුළු ලකුණු 08)

04. (i) (අ) සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු සාධක 02 ක් ලියන්න.

(ආ) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි 02 ක් ලියා දක්වන්න. (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව වාණිජ බැංකුවකි. ( )

(ආ) ස්ථාවර තැන්පතුවේ කාලය හා තැන්පතුවේ වටිනාකම අනුව පොලී ප්‍රතිශතය වෙනස් වේ. ( )

(ඉ) අප රටට අවශ්‍ය කිරිපිටි, ඉන්ධන ආදිය විදේශ රටවලින් මිලදී ගැනීම අපනයන වෙළෙඳාමට නිදසුන් වේ. ( )

(ඊ) බරින් අධික ද්‍රව්‍ය ප්‍රවාහනය කළ හැකි වීම ගුවන් මාර්ග ප්‍රවාහනයේ වාසියකි. ( )

(ල. 02)

(iii) මල්ශාන්ගේ රු. 2 000 000 ක් වටිනා මෝටර් රථය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එම වටිනාකමට රක්ෂණය කර තිබූ අතර එම රථය ත්‍රීරෝද රියක ගැටී අනතුරකට භාජනය වී රු. 200 000 ක අලාභයක් සිදු විය.

ඉහත සිද්ධියට අදාළව රක්ෂණයට සම්බන්ධ පහත දෑ නම් කරන්න.

(අ) පළමු පක්ෂය

(ආ) දෙවන පක්ෂය

(ඉ) තෙවන පක්ෂය

(ඊ) මල්ශාන්ට ලැබෙන වන්දි මුදල (ල. 02)

(iv) කතරගම පූජා නගරයේ රසකැවිලි ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන තරුෂි සිය නිෂ්පාදිත හඳුන්වාදීමට නොමිලේ සාම්පල් බෙදාදීම සිදු කරයි. එමෙන්ම ඇතැම් නිෂ්පාදන සඳහා වට්ටම් ලබාදීමක් සිදුකරයි.

ඉහත සිද්ධියේ දක්නට ලැබෙන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් උදාහරණ සමගින් ලියා දක්වන්න.

(ල. 02) (මුළු ලකුණු 08)

## II කොටස

05. (i) (අ) ව්‍යාපාරයක හිමිකම යනු කුමක් ද? (ල. 01)

(ආ) ගිණුම්කරණ සමීකරණයේ වත්කම් හා වගකීම් සමාන අගයකින් වැඩිවන ගනුදෙනුවක් ලියන්න. (ල. 01)

(ii) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු දෙකකට අදාල ද්විත්ව සටහන පහත දැක්වේ.

(අ) ගැනුම් ගිණුම හර - 25 000

ණය හිමි ගිණුම - බැර 50 000

(ආ) බැංකු ණය ගිණුම හර - 25 000

මුදල් ගිණුම බැර - 25 000

ඉහත සිදු වී ඇති එක් එක් ගනුදෙනුව ලියන්න. (ල. 02)

(iii) පහත දැක්වෙන ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය තුල නිරූපණය කළ යුතු ආකාරය පහත ආකෘතිය තුල සඳහන් කරන්න.

(වැඩිවීමක් නම් + හා අඩුවීමක් නම් (-) ලකුණ යොදන්න.)

1. 2025/01/01 රු. 500 000 යොදා ව්‍යාපාරය ඇරඹීම
2. 2025/01/05 රු. 75 000 ක තොගයක් ණයට ගැනීම
3. 2025/01/10 රු. 40 000 ක තොගයක් රු. 45 000 ට අත්පිට විකිණීම
4. 2025/01/15 රු. 3 000 ක විදුලි බිල ගෙවීම
5. 2025/01/20 රු. 30 000 ක උපකරණයක් අත්පිට මිලදී ගැනීම (ල. 02)

(අ)

| අංකය | වත්කම | | = හිමිකම | | + වගකීම් |
|---|---|---|---|---|---|
| | උපකරණ | තොග | මුදල් | හිමිකම | බැංකු ණය |
| (01) | - | - | + 500 000 | + 500 000 | - |
| (02) | | | | | |
| (03) | | | | | |
| (04) | | | | | |
| (05) | | | | | |

(ආ) එම ගනුදෙනු අවසානයේ පහත දෑ ගණනය කරන්න

(1) ජංගම වත්කම්

(2) ජංගම නොවන වත්කම්

(3) හිමිකම

(4) ජංගම වගකීම් (ල. 02)

(iv) සුමුදුගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2025 ජනවාරි මාසයේ පහත ගනුදෙනු සිදු විය.

1. 01/ 05 එකක් රු. 250 බැගින් අභ්‍යාස පොත් 20 ක් රුවන්ගෙන් ණයට ගැනීම (ඉන්වොයිස් අංක 512) අඩුකළ වෙළඳ වට්ටම 5%

2. 01/15 එකක් රු. 80 බැගින් බිස්කට් පැකට් 50 ක් නාලකගෙන් ණයට ගැනීම (ඉන්වොයිස් අංක 870)

3. 01/25 එකක් රු. 80 000 බැගින් පරිගණක 2 ක් කාර්යාලයේ භාවිතයට සිංගර් ආයතනයෙන් ණයට ගැනීම.

අවශ්‍ය වන්නේ,

(අ) 2025 ජනවාරි මාසයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම (ල. 02)

(ආ) 2025/01/31 දිනට ගැනුම් ජ'නලයේ තොරතුරු ලෙජරයට පිටපත් කිරීම (ල. 02)

(මුළු ලකුණු 12)

06. (i) (අ) ''ශේෂ පිරික්සුම'' යනු කුමක් ද? (ල. 01)

(ආ) ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි 2 ක් ලියන්න. (ල. 01)

(ii) 2025/05/31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 1500 කි. මැයි මාසයේ සුළු වියදම් විශ්ලේෂණය තීරුවල ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| සංග්‍රහ වියදම් | 1800 |
| ලිපි ද්‍රව්‍ය | 2700 |
| ගමන් වියදම් | 2400 |
| විවිධ වියදම් | 1600 |

(අ) 2025 මැයි මාසයේ සුළු මුදල් වියදම කොපමණ ද? (ල. 01)

(ආ) 2025 ජුනි මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය රු. 5000 ක් වැඩි කිරීමට තීරණය කර ඇත්නම් 2025/06/01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණ ද? (ල. 01)

(iii) සමන්තිගේ ව්‍යාපාරයේ 2024.05.31 බැංකු ගිණුමේ දක්වුණු ශේෂය රු. 24 500 කි.එදිනට බැංකුව විසින් එවා ඇති බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එය එකඟ නොවීය.

වෙනසට පහත හේතු බලපෑ ඇති බව අනාවරණය විය.

1) සෘජු ණයගැති ප්‍රේෂණ රු. 8 000 කි.

2) බැංකුව අය කළ බැංකු ගාස්තුව රු. 1 750 කි.

3) තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් රු. 3 000 කි

4) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 9 000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) සංශෝධිත බැංකු ගිණුම පිළියෙල කරන්න. (ල. 02)

(ආ) බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න. (ල. 02)

(iv) ජනකගේ ව්‍යාපාරයේ 2025.01.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ එකතුන් සමාන නොවූ අතර වෙනස රු. 8 100 අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදි. පසුව කල පරීක්ෂා කිරීමේදී පහත වැරදි අනාවරණය විය.

1) රු. 4 000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වල දෙවරක් සටහන් වීම.

2) රු. 9 000 ක පොලි ආදායම ලැබීම පොලී ආදායම් ගිණුමේ 900 ලෙස සටහන් වීම.

3) රු. 13 000 සේවක වැටුප් ගෙවීම පොත්වල සම්පූර්ණයෙන්ම සටහන් වී නොතිබීම.

අවශ්‍යවන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් ලියා දක්වන්න. (ල. 03)

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න. (ල. 01)

(ල. 12)

(මුළු ලකුණු 12)

07. (i) (අ) උපචිත සංකල්පය පැහැදිලි කරන්න.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූලිකාංග 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) ව්‍යාපාරයක් රු. 450 000/- ක් 10% ස්ථාවර තැන්පතුවක 2024.01.01 ආයෝජනය කර ඇත. ලැබී ඇති පොළී ආදායම රු. 42 000 කි.

(අ) ලැබිය යුතු පොලී ආදායම සොයන්න.

(ආ) එහි ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 02)

(iii) තනූජා නිමි ඇඳුම් අලෙවි ව්‍යාපාරයේ 2024.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| බෙදාහැරීමේ රථය (පිරිවැයට) | 650 000 | |
| බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (24/01/01) | | 50 000 |
| තොගය (24/01/01) | 40 000 | |
| ගැනුම් | 360 000 | |
| විකුණුම් | | 585 000 |
| ණය ගැතියෝ | 42 000 | |
| ණය හිමියෝ | | 28 000 |
| ලද වට්ටම් | | 3 000 |
| දුන් වට්ටම් | 2 000 | |
| විදුලි ගාස්තු | 6 000 | |
| 12% බැංකු ණය | | 200 000 |
| බැංකු ණය පොලී | 9 000 | |
| රක්ෂණ ගාස්තු | 3 000 | |
| මුදල් ශේෂය | 54 000 | |
| ප්‍රාග්ධනය | | 300 000 |
| | 1 166 000 | 1 166 000 |

අතිරේක තොරතුරු

1. 2024/12/31 දිනට ඉතිරි තොගය 60 000
2. රු. 2000 ක ණය ගැතියෙකු බොල් ණය ලෙස කපා හළ යුතුය.
3. බෙදා හැරීම් රථය සරළ මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% ක් ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ

(අ) 2024/12/31 න් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ල. 04)

(ආ) 2024/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ල. 04)

(මුළු ලකුණු 12)

**11 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය 2025** **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 4 ) | 02. ( 3 ) | 03. ( 2 ) | 04. ( 1 ) | 05. ( 4 ) | 06. ( 3 ) | 07. ( 1 ) | 08. ( 3 ) | 09. ( 3 ) | 10. ( 1 ) |
| 11. ( 1 ) | 12. ( 4 ) | 13. ( 3 ) | 14. ( 4 ) | 15. ( 1 ) | 16. ( 2 ) | 17. ( 3 ) | 18. ( 1 ) | 19. ( 2 ) | 20. ( 4 ) |
| 21. ( 3 ) | 22. ( 2 ) | 23. ( 4 ) | 24. ( 3 ) | 25. ( 1 ) | 26. ( 1 ) | 27. ( 4 ) | 28. ( 2 ) | 29. ( 2 ) | 30. ( 3 ) |
| 31. ( 2 ) | 32. ( 2 ) | 33. ( 1 ) | 34. ( 4 ) | 35. ( 3 ) | 36. ( 2 ) | 37. ( 3 ) | 38. ( 4 ) | 39. ( 4 ) | 40. ( 3 ) |

## II පත්‍රය

01. (i) (අ) හවුල් ව්‍යාපාර (ල. 01)

(ආ) අනිවාර්ය වේ.
ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම් වලින් හැර වෙනත් නාමයකින් පවත්වාගෙන යන නිසා (ල. 01)

(ii) (අ) බේකරි නිෂ්පාදනය පිළිබඳ පාඨමාලාවන් හදාරා තිබීම
ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම/ මූල්‍ය ශක්තියක් තිබීම } ශක්තීන් (ල. 01)

(ආ) ආසන්නයේ තිබෙන බේකරිය (තරඟකරුවා) - තර්ජන

(ඉ) නුපුහුණු සේවකයන් සිටීම - දුර්වලතා

(ඊ) ජනාකීර්ණ මංසන්ධියක පිහිටා තිබීම
ඉහළ ඉල්ලුමක් තිබීම } අවස්ථා (ල. ½ x 4= 02)

(iii) (අ) උපකාරක සේවා නිදසුන
බැංකු සේවා - බැංකු ණය ලබාගැනීම
ප්‍රවාහනය - ත්‍රීරෝද රථයක් කුලියට ගැනීම (ල. ½ x 2= 01)
නිදසුනක් සමඟ තිබිය යුතුයි.

(ආ) 1. අවට හොටල් හා ආපන ශාලවලට විකිණීම
2. ඔවුන්ගෙ වෙළඳ සැල තුල විකණීම (ල. ½ x 2= 01)

(iv) (අ) නිෂ්පාදිතය
(ආ) ස්ථානය
(ඉ) සංවිධානකරණය
(ඊ) පාලනය (ල. ½ x 4= 02)

(v)

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| | | | | (ල. ½) |
| මුදල් + 600 000 | | ප්‍රාග්ධනය + 600 000 | | |
| මුදල් + 600 000 | | | | බැංකු ණය + 600 000 |
| යන්ත්‍ර + 100 000 | | | | |
| මුදල් - 300 000 | | | | (ල. ½) |
| 1200000 | | 600 000 | | 6000 |

(ල. 02)

(vi) (අ)
$$600000 \times \frac{10}{100} \times \frac{1}{12}$$
$$= 5000$$

(ආ) ණය පොලි ගිණුම හර 5000
උපචිත/ ණය පොලි ගිණුම 5000 (ලකුණු 01)

(vii) (අ)
$$300000 \times \frac{6}{100} \times \frac{1}{12}$$
$$= 1500$$

(ල. 01)

**පිළිතුරු පත්‍රය - II**

(ආ 300000 - 1500 =298500

(viii)

මුදල් ගිණුම (ල. ½)

| විස්තරය | වටිනාකම | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 600 000 | යන්ත්‍ර ගැණුම් | 300 000 |
| බැංකු ණය | 600 000 | අමුද්‍රව්‍ය ගැණුම් | 200 000 |
| විකුණුම් | 490 000 | ගොඩනැගිලි කුලි | 20 000 |
| | | ත්‍රීරෝධ රථ කුලී | 15 000 |
| | | ඇසුරුම් වියදම් | 10 000 |
| | | විදුලි ගාස්තු | 10 000 |
| | | සේවක වැටුප් | 30 000 |
| | | ශේෂය ප/ගේ | 1 105 000 |
| | 1 690 000 | | 1 690 000 |
| ශේෂය ඉ/ගෙ | 1 105 000 | | |

අයිතම 03 ක් නිවැරදි නම් ½ බැගින් ලබා දෙන්න.

(ix)

ආදායම්

| | | |
|---|---|---|
| විකුණුම් ආදායම | | 490 000 |
| **(-) වියදම්** | | |
| යන්ත්‍ර ක්ෂය | 1500 | |
| ණය පොලි | 5 000 | |
| අමුද්‍රව්‍ය ගැණුම් | 280 000 | |
| ගොඩනැගිල කුලී | 20 000 | |
| සේවක වැටුප් | 30 000 | |
| ත්‍රීරෝධ රථ කුලී | 15 000 | |
| ඇසුරුම් වියදම් | 10 000 | |
| විදුලි ගාස්තු | 10 000 | 371 500 |
| ශුද්ධ ලාභය | | 118 500 |

නිවැරදි අයිතම තුනකට ½

(ල. 02)

(x) (අ)

| | | |
|---|---|---|
| 2025/03/01 | හිමිකම | 600 000 |
| 2025/03/31 | ශුද්ධ ලාභය | 118 500 |
| 2025/03/21 | හිමිකම | 718 500 |

(ල. 02)

(මුළු ලකුණු 20)

02. (i) (අ) අතිරික්ත භාණ්ඩ තවත් අතිරික්ත භාණ්ඩ තොගයක් සමග හුවමාරු කිරීම/ භාණ්ඩ අතිරික්තය අනෙකුත් පුද්ගලයන් සමඟ හුවමාරු කර ගනිමින් ඔවුන්ට අවශ්‍ය අනෙකුත් භාණ්ඩ ලබා ගැනීම (ල. 01)

භාණ්ඩ හුවමාරු ක්‍රමය පමණක් ඇත්නම් ලකුණු ½

(ආ) භාණ්ඩ ඇණවුම් කිරීම

මුදල් ගෙවීම

ප්‍රචාරණ කටයුතු (ල. 01)

(ii) (අ) අසත්‍යය (ආ) අසත්‍යය (ඉ) සත්‍යය (ඊ) සත්‍යය (ල. 02)

(iii) (අ) දේශපාලන පරිසරය (ල. 01)

(ආ) - අඩු පොලි ණය ක්‍රම හඳුන්වා දීම (ල. 01)

(iv) (අ) අධ්‍යාපනය

සෞඛ්‍යය

ආහාර

ආරක්ෂාව

3ක් හෝ 4 ක් නිවැරදි නම් ලකුණු 1 යි. 2 ක් නිවැරදි නම් ල. ½

(ආ) සේවා නිෂ්පාදන ව්‍යාපාර
සේවා නිෂ්පාදන ව්‍යාපාර
භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
භාණ්ඩ නිස්පාදන ව්‍යාපාර
3 ක් හෝ 4 ක් නිවැරදි නම් ලකුණු 01 ක් 2 ක් නිවැරදි නම් ලකුණු ½ (මුළු ලකුණු 08)

03. (i) (අ) ව්‍යාපාරයේ ප්‍රාග්ධනය
සේවක සංඛ්‍යාව
භාවිත කරක බලශක්ති ප්‍රමාණය
ව්‍යාපාරයට ඇති වෙළෙඳපොල කොටස
(ආ) හවුල්කරුවන් අතර ඇති කරගන්නා එකඟතාවයක් වේ. (ල. 02)
(ii) (අ) සත්‍යය (ආ) අසත්‍යය (ඉ) අසත්‍යය (ඊ) සත්‍යය (ල. 02)
(iii) (අ) හවුල් ව්‍යාපාර
(ආ) සංස්ථාපිත සමාගම්
(ඉ) රාජ්‍ය සංස්ථා
(ඊ) තනි පුද්ගල ව්‍යාපාර (ල. 02)
(iv) (අ) හරපත
(ආ) ක්ෂණික බව, අවදානම අඩුවීම, සියලු තොරතුරු ස්වයංක්‍රීයව වාර්තා වීම
දවසේ ඕනෑම වෙලාවක ගනුදෙනු කතළ හැකි වීම (ල.02)
(මුළු ලකුණු 08)

04. (i) (අ) භාණ්ඩයේ ස්වභාවය, පිරිවැය, ධාරිතාව, ආරක්ෂාව, වේගය, සුලභතාව
(ආ) චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම
අයිරා පහසුකම් ලබා ගත හැකි වීම
ඍජු ප්‍රේෂණ රැස් කිරීම
ස්ථාවර නියෝග ක්‍රියාක්මක කිරීම
බැංකු ප්‍රකාශ ලැබීම (ල. 02)
(ii) (අ) අසත්‍යය (ආ) සත්‍යය (ඉ) අසත්‍යය (ඊ) අසත්‍යය (ල. 02)
(iii) (අ) මල්ශාන්
(ආ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
(ඉ) අනතුරට ලක් වූ ත්‍රී රෝද රථය
(ඊ) රු. 200 000 (ල. 02)
(iv) නිෂ්පාදිතය - රසකැවිලි
මිල - වට්ටම්
ස්ථානය - කතරගම පූජා නගරයේ වෙළෙඳසැල
ප්‍රවර්ධනය - නොමිලේ සාම්පල් බෙදා දීම (ල. 02)

05. (i) (අ) ව්‍යාපාරයක හිමිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය හිමිකමයි (ල. 01)
(ආ) රු. 50 000 ක බැංගු ණය ගැනීම, භාණ්ඩ ණයට ගැනීම වැනි (ල. 01)
(ii) (අ) රු. 50 000 ක භාණ්ඩ ණයට මිල දී ගැනීම
(ආ) රු. 25 000 ක බැංකු ණයක් ආපසු ගෙවීම (ල .02)
(iii) (අ)

| අංකය | වත්කම | | | = හිමිකම | + වගකීම් |
|---|---|---|---|---|---|
| | උපකරණ | තොග | මුදල් | හිමිකම | ණය හිමි |
| (1) | - | - | + 500 000 | + 500 000 | - |
| (2) | | + 75 000 | | | +75 000 |
| (3) | | (40 000) | + 45 000 | + 5 000 | |
| (4) | | | (- 3 000) | (- 3000) | |
| (5) | + 30 000 | | (30 000) | | |
| | 30 000 | 35000 | 512 000 | 502 000 | 75 000 |

(ල .02)

## පිළිතුරු පත්‍රය - II

(ආ) ජංගම වත්කම් - 547 000

ජංගම නොවන වත්කම් - 30 000

හිමිකම 502 000

ජංගම වගකීම් 75 000 (ල. ½ x 4= 02)

(iv) (අ)

ගැනුම් ජ'නලය (ල. ½)

| දිනය | ඉ.අ. | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි. |
|---|---|---|---|---|
| 25/1/5 | 512 | රුවන් | (ල. ½) 4750 | |
| 25/1/15 | 870 | නාලක | (ල. ½) 4000 | |
| 25/1/31 | | ගැනුම් ගිණුමට හර කළා (ල. ½) | 8750 | (ල. ½) |

(ල. 02)

(ආ)

ගැනුම් ගිණුම

| | |
|---|---|
| 15/31 ණයහිමි 8 750 | |
| (ල.01) | |

ණයහිමි ගිණුම

| | |
|---|---|
| | 1/5 ගැනුම් ගිණුම 4750 |
| (ල.½) | (ල.½) |

ණයහිමි නාලක

| | |
|---|---|
| | 1/15 ගැනුම් 4000 |
| | (ල.½) |

(ල. 02)

නිවැරදි ආකෘතිය සහිත ගිණුමට ½

(මුළු ලකුණු 12)

06. (i) (අ) යම් ගිණුම් කාලඡේදයක් අවසානයේදී ලෙජර් ගිණුම්වල හර හා බැර ශේෂ වෙන වෙනම තීරු දෙකක ඇතුලත් කර පිළියෙල කරන ලැයිස්තුවයි. (ල. 1)

(ආ) නිවැරදි පිළිතුරකට ලකුණු ලබාදෙන්න.

(ල. 01)

(ii) (අ) 8 500/- (ල. 01)

(ආ) 13 500/ - (ල. 01)

(iii)

බැංකු ගිණුම (සංශෝධිත)

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| (ල. ½) | ශේෂය ඉ/ගෙ | | 24 500 | | බැංකු ගාස්තු | | 1750 | (ල. ½) |
| (ල. ½) | ණයගැති ප්‍රේෂණ | | 8 000 | | | | | |
| | | | 32500 | | ප/ගෙ ශේෂය | | 30750 | (ල. ½) |
| | ශේෂය ඉ/ගෙ | | 30 750 | | | | 32500 | |

(ල.02)

බැංකු සැසඳුම්

| | | | |
|---|---|---|---|
| බැංකු ගිණුමේ (සංශෝධිත) ශේෂය | | 30 750 | (ල. ½) |
| <u>එකතු කළා</u> | | | |
| නිකුත් කල ගෙ/ඉ නොවූ චෙක්පත් | 4 300 | 9 000 | (ල. ½) |
| | | 39 750 | |
| <u>අඩු කළා</u> | | | |
| තැන්පත් කළ නි/නෝ චෙක්පත් | 12 000 | (3 000) | (ල. ½) |
| 2024/05/31 දිනට බැ.ප්‍ර. අනුව ශේෂය | | 36 750 | (ල. ½) |

(ල.02)

**පිළිතුරු පත්‍රය - II**

(iv)

| දිනය | ව.අ. | විස්තරය | ලෙ.ජ. | හර (රු.) | බැර (රු.) | |
|---|---|---|---|---|---|---|
| 1 | | ණයහිමි ගිණුම හර<br>ගැනුම් ගිණුම බැර<br>(රු. 4 000 ක ණයට ගැනුම් දෙවරක් ගිණුම්ගත වීම නිවැරදි කිරීම | | 4 000 | 4 000 | (ල.01) |
| 2 | | අවිනිශ්චිත ගිණුම හර<br>පොලී ආදායම් බැර<br>(පොලී ආදායම් ලැබීම රු .8 100 කි. එම ගිණුමේ අඩුවෙන් සටහන් වීම නිවැරදි කිරීම | | 8 100 | 8 100 | (ල.01) |
| 3 | | වැටුප් ගිණුම හර<br>මුදල් ගිණුම බැර<br>(වැටුප් ගෙවීම මගහැරීම නිවැරදි කිරීම | | 13 000 | 13 000 | (ල.01) |

අවිනිශ්චිත ගිණුම

| | | | |
|---|---|---|---|
| පොලී ආදායම් | 8 100 | ශේ.පිරි.වෙනස | 8 100 |
| | 8 100 | | 8 100 |

(ල.04)

(මුළු ලකුණු 12)

07. (i) (අ) ආදායම් වලට අදාලව මුදලින් ලැබුන ප්‍රමාණය කුමක් වුවත් වියදම් වලට අදාලව මුදලින් ගෙවූ ප්‍රමාණය කුමක් වුවත් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කළ යුතු වන්නේ කාලච්ඡේදයට අදාල ප්‍රමාණය (ල. 01)

(ආ) වත්කම්, වගකීම්, හිමිකම් (ල. 01)

(ii) (අ) රු. 3000 (ල. 01)

(ආ) ලැබිය යුතු පොලී ආදායම් ගිණුම හර 3 000
පොලී ආදායම් ගිණුම බැර 3000 (ල. 01)

## පිළිතුරු පත්‍රය - II

(iii)

තනූජා නිම් ඇඳුම් ව්‍යාපාරයේ 24. 12. 31 අවසන් වර්ෂය සඳහා ලාභ හෝ ලාභ ප්‍රකාශනය (ල.½)

| | | | | |
|---|---|---|---|---|
| විකුණුම් | | | 585 000 | |
| (-) විකුණුම් පිරිවැය | | | | |
| ආරම්භක තොගය | | 40 000 | | |
| (+) ගැනුම් | | 360 000 | | |
| | | 400 000 | | |
| (-) අවසන් තොගය | (ල.½) | (60 000) | (340 000) | (ල.½) |
| | | | 245 000 | (ල.½) |
| (+) වෙනත් ආදායම් | | | | |
| ලද වට්ටම් | | 3 000 | 3 000 | (ල.½) |
| | | | 248 000 | |
| බෙදා හැරීමේ වියදම් | | | | |
| බොල් ණය (ල.½) | 2 000 | | | |
| බෙදාහැරීමේ රථ ක්ෂය (ල.½) | 130 000 | | | |
| දුන් වට්ටම් | 2 000 | 134 000 | | |
| පරිපාලන වියදම් | | | | |
| විදුලි ගාස්තු | 6 000 | | | |
| රක්ෂණ ගාස්තු | 3 000 | 9 000 | | |
| මූල්‍ය වියදම් | | | | |
| බැංකු ණය පොලී (ල.½) | 24 000 | 24 000 | (167 000) | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා (ල.½) | | | 81 000 | |

(ල. 04)

තනූජා නිම් ඇඳුම් ව්‍යාපාරයේ 24. 12. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ල.½)

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ අගය | |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | | |
| බෙදාහැරීමේ රථ | 650 000 | (ල.½) 180 000 | (ල.½) 470 000 | (ල.½) |
| ජංගම වත්කම් | | | | |
| අවසන් තොගය | | (ල.½) 60 000 | | |
| ණය ගැතියෝ | | (ල.½) 40 000 | | |
| මුදල් ශේෂය | | 54 000 | 154 000 | |
| | | | 624 000 | |
| ප්‍රාග්ධනය | | 300 000 | | |
| (+) ශුද්ධ ලාභය | (ල.½) | 81 000 | 381 000 | |
| ජංගම නොවන වගකීම | | | | |
| 12% බැංකු ණය | | 200 000 | 200 000 | |
| ජංගම වගකීම් | | | | |
| ණය හිමියෝ | | 28 000 | | |
| උපචිත ණයපොලී | (ල.½) | 15 000 | 43 000 | |
| | | | 624 000 | |

(ල. 04)

(මුළු ලකුණු 12)